# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය

2019.09.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2019 හි විධිවිධාන පරිදි පුරප්පාඩුව පවතින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරු දෙක සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවය 1 පන්තිය 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. මූලික සුදුසුකම්**

i. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තිය 1 ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

ii. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබිය යුතු අතර, එම වසර 03 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

iii. අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 03 තුළ කිසිදු විනයානුකූල දඬුවමකට ලක් වී නොතිබිය යුතුය.

03. ඉහත මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, එහිදී දක්වනු ලබන කුසලතා සඳහා ලකුණු ලබා දීමේ පරිපාටියකට අනුව ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ. (ලකුණු ලබා දීමේ පරිපාටිය www.ird.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත)

04. ඉහත මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් www.ird.gov.lk වෙබ් අඩවියේ ඇති අයදුම්පත්‍රය අනුව සැකසූ අයදුම්පත්‍රයක් නිවැරදිව සම්පූර්ණ කර 2021.02.21 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් පහත ලිපිනයට භාර දිය යුතුය. අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා අයදුම්පත" ලෙස සඳහන් කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර නොගැනේ.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්,**
**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,**
**තැ.පෙ. 515, කොළඹ 02.**

**දුරකථන අංක : 011-2135450 / 011-2135453**

**ෆැක්ස් : 011-2338639**

**ඊමේල් : herath.hmcm@ird.gov.lk**

**දිනය 2021.02.08**